5 වන පිටෙන්

වටහා ගත හැකිය. කාගේ නිර්මාණයක් නැරඹුවත් ප්‍රේක්ෂකයා එය විඳින්නේ තම අත්දැකීම් පදනම් කරගෙනය. තමාට එම අත්දැකීමේ හි සමීපභාවය අනුව සහ සංවේදිතාව අනුව, දැනෙන හැඟීම හෝ රසය වෙනස් විය හැකිය.

එමෙන්ම, එදිනෙදා ජීවිතයේදී ද අප රංගවේදීහූ සහ ප්‍රේක්ෂකයෝ බවට පත්වෙති. එම සංසිද්ධීන් පිළිබඳ විශ්ලේෂණය ද රංග කලාවට අයිති දෙයකි. පෙර සඳහන් කළ රංගකලා සිද්ධාන්ත අනුව එය උදාහරණ මගින් විස්තර කරනු මම කැමැත්තෙමි. යමෙක් ගමනක් යෑමට සූදානම්ව ඒ සඳහා සුදුසු සේ සැරසීම, තම ගමනේ ස්වභාවය ද, තමාගේ තත්වය ද, සහ ඒ මුණගැසෙන පුද්ගලයන් තමා දකි න්නට කැමති ආකාරය ද ආදිය සිතා හෝ නොසිතා සිදු කරන සංකීර්ණ ක්‍රියාවලියකි. එම තැනත්තා තම ස්වරූපය හෝ ප්‍රතිරූපය සඳහා ප්‍රේක්ෂාවක් අපේක්ෂා කරයි. ඒ අනුව අතට හසුවෙන යමක් ඇඟට දමාගෙන යන්නෙක් පවා ප්‍රේක්ෂාවක් බවට පෙරලනු ලබයි. ශරීරයේ මස් පිඬු ව්‍යායාම මගින් වර්ධනය කරගැනීමෙන් ද, සිහින් සිරුරක් ගොඩ නැංවීමෙන් ද, පච්චා මගින් ශරීරය කැන්වසයක් බවට පත් කිරීමෙන් ද, කරන්නේ නිරූපනයයි. එහිදී ද පළමු ප්‍රේක්ෂකයා වන්නේ එහි නියුක්ත වන්නාය. මෙයද රසවිඳීමකි.

එමෙන්ම ස්වභාවික අලංකාරයක් හෝ මනුශ්‍ය නිර්මිත අලංකාරයක් නැරඹීම ද මේ හා සමාන ක්‍රියාවලියකි. එහිදී හුදකලාව හෝ සමූහයක් ලෙස එම අත්දැකීම වින්දනය කරනු ලබයි. නිර්මානය ස්ථිරව පවතින අතර, නරඹන්නෝ නියුක්තිකයෝ සහ ප්‍රේක්ෂකයෝ බවට පත්වෙති. සමූහයක් ලෙස නරඹන්නේ නම්, අනෙකුන් ගේ ප්‍රතිචාර ද, එම ප්‍රතිචාර මගින් ගොඩනැගෙන අනෙකුන්ගේ දායකත්වය ද, ඒ නරඹන්නන් අතර තමා නරඹන දෙය මූලික කරගනිමින් කරනා රංග ක්‍රියා ගනුදෙනුවකි.

ඔබ රංගයක් නැරඹීමට ගිය අවස්ථාවක් සිහි කැඳවයි නම්, එහි වූ ප්‍රේක්ෂකාගාරයේ හෝ ඒ රංග භූමියට පිවිසීමේ සිට රංගයේ කොටස් කරුවෙකු වූ බව සිහිපත් කරගත හැක. ඇතැම් නිර්මාණකරුවෝ දැනුවත්වම, ප්‍රේක්ෂක ආලින්දය ද රංග අවස්ථාවක් බවට පත් කරගනිති. ඔබ 'The God King Drama' (2014) නාට්‍ය Monsh Performing Arts Center හි නැරඹා ඇත්නම් මේ කියන කාරනය සිහි කැඳවිය හැකිය. ඔබ නැවත වාරයක් ඕනෑම රංගයක් බලනට යන කළ මේ අවබෝධයද රැගෙන යන ලෙස මම ඔබෙන් ඉල්ලා සිටිමි.

(මතු සම්බන්ධයි)


## නිවසක් විකිණීමට කිරිඳිවැල

5 bedroom house in Kirindiwela, Gampaha Main Rd

**Upstairs-** 2 bedrooms, 1 bathroom with toilet, living area and balcony
**Downstairs-** 3 bedrooms, 1 bathroom with toilet, lounge room, dining area, kitchen with teak pantries, separate external toilet and kitchen
**Double garage**
**Solar hot water**





**Land**
1 acres + 30.6 purches
(190.6 purches)
with Bimsaviya title

**Price- $600 000 AUD**

විමසීම් - ගාමිණී 0417 512 578



**Mariane Fernando**
Member ACA & Counsellors Victoria Inc.
Trained by Transgender Victoria

Offering counselling services for:
- Relationship
- Addiction
- Grief and loss
- Family
- Anger management
- Anxiety and stress

First session free

Medibank Private Health Fund rebates may be available

9798 7005 or 0423 364 618



**NAATI Translator**
Sinhalese/English
**සිංහල ඉංග්‍රීසි පරිවර්තන**
(Certificates/Documents for Visa matters)

**Nadie Kammallaweera**
Tel: 0481 179 189
Email: nadiekammallaweera@gmail.com



